PAPER

## හෙන්නානිගල වත්මන් ආදිවාසියා රෝගියෙක්ද?

ඒ.එස්.පී.පී. පනාගොඩ, ආනන්ද විද්‍යාලය, කොළඹ 10


ශ්‍රී ලංකාවේ වෙසෙන ප්‍රාථමික ජන සමාජ අතරින් වඳවී යාමේ තර්ජනයට ලක්වී ඇති ජන සමාජයක් වශයෙන් ආදිවාසීන් හැඳින්විය හැකිය. වැද්දන් ,පුලින්දයන් ,සබරුන්, ආදිවාසීන්, යන නම් වලින් මොවුන් අදවිට හඳුන්වයි. මොවුහු අතීතියේ තෙත් කළාපයේ විවිධ පළාත් ,නගරවල් හි පදිංචිව සිටි අතර අද වන විට වියළිකළාපයේ ප්‍රදේශ කිහිපයකට සීමා වී පදිංචිව සිටිති. උදාහරණ ලෙස දඹාන,හෙන්නානිගල,නිල්ගල,රතුගල,දලුකාන,පොල්ලෙබැද්ද, වාකරේ, එම ප්‍රදේශයි. මේ හැරුණු විට අප්‍රකට වශයෙන් මනම් පිටිය, කුඩාවැව,දිඹුලාගල,යක්හුරේ, වැනි ප්‍රදේශ ඇතුළුව තවත් ප්‍රදේශ විස්සක පමණ ආදිවාසී පවුල් කුඩා සංඛ්‍යා වශයෙන් පදිංචිව සිටිති. ආදිවාසී හිමිනමක් ද දිඹුලාගල ප්‍රදේශයේ වාසය කිරීම දැකිය හැකි විශේෂ සිද්ධියකි.

මෙලෙස තෙත් කළාපය හෝ අනෙකුත් වානාන්තර හි නිජබිම් සිය වාසයන් කොට ගනිමින් ජීවිතය පවත්වාගෙන ගිය ආදිවාසී හු 40 දශකය පමණ වන විට කැලෑ ජීවිතයෙන් එළියට ගැනීම, විදේශ විද්වත්තුන්ගේ මැදිහත් වීම හා පැවති රජයන් විසින් සිදු කරන්නට ඇතිබව පෙනේ. ස්පිටල් මහතාගේ ගවේශන වලින් පසු මේ තත්වය උද්ගත වූ බව හෙන්නානිගල ආදිවාසීහු සිය අදහස් වලදී දක්වති. ශ්‍රී ලංකාවේ ආරම්භ කෙරුණු ප්‍රධාන සංවර්ධන යෝජනා ක්‍රම හේතුවෙන් සිය නිජබිම් සම්පූර්ණයෙන්ම අහිමිව බව අපද දන්නා කරුණකි.

එම නිජබිම් අහිමි වීමත් සමග කැලෑ ප්‍රදේශයෙන් එළියට හෙවත් මහ සමාජ හා සම්බන්ධව විවිධ ප්‍රදේශයන්හි පදිංචි කරන ලදී. ඒ අනුව එක් එක් කැලෑ ප්‍රදේශයන්හි ජීවත්වූ ආදිවාසීන් ඉහත සඳහන් කැලෑ ප්‍රදේශයන්හි විවිධ නායකත්ව යටතේ පදිංචිය කරවන ලදී. ඒ පදිංචිකරවන ලද ආදිවාසී පිරිස් අතර සුවිශේෂි වූ ආදිවාසී කොට්ඨාසයක් ලෙස හෙන්නානිගල ආදිවාසීන් හැඳින්විය හැක. තැපැල් බණ්ඩියා හා කලුඅප්පු එහි ප්‍රධාන නායකත්වය ගත් අතර වර්තමානය වන විට තලාවරිගයේ ගුණබණ්බා නායකත්වය සපයයි. ඉන් කලුඅප්පු ජීවතුන් අතර සිටී. මේ වන විට හෙන්නානිගල දකුණු ප්‍රදේශයේ ආදිවාසී පවුල් 450 ක් පමණ වාසය කරණ අතර මොවුන්ගේ ආයුෂ ඉතා ඉහල අගයක පවතී. දැනට ශ්‍රී ලංකාවේ වයොවෘද්ධම පුද්ගලයන් අතර හෙන්නානිගල කලුඅප්පු (වයස අවු 111) මෙන්ම තවත් වයස අවු 100 ආසන්න කාන්තාවන් කීපදෙනෙක්ම ජීවත් වෙති.

ආදිවාසීන් හෙන්නානිගල දකුණු ප්‍රදේශයේ පදිංචි කරවීමේදී ගොඩ මඩ ඉඩම් ප්‍රධානය කල අතර ඉන් පසු ඔවුන් පිළිබඳව සොයා නොබැලුහ එනිසා අද වන විට ඔවුහු ආර්ථික, සමාජ අතින් අසරණ තත්වයට පත්ව ඇත. අද වනවිට ඔවුනට කැලෑව තහනම්ය. කැලෑවට යාමට අවසර ලැබී ඇත්තේ ආදිවාසීන් 10 දෙනෙකුට වීම විශේෂ ලත්ෂණයකි. කැලෑවට යන ආදිවාසීන් විවිධ හේතුන් මත ඝාතනය වීමද විශේෂ සිද්ධියකි.

එනයින් පෙනී යන්නේ ආදිවාසීන්ට සිය ජීවන උරුමය ක්‍රමක්ක්‍රමයෙන් අහිමි වන බවයි. මේ තත්වය හේතුකොට ගෙන ආදිවාසීන්ට මහ සමාජයේ විවිධ ක්‍රියාකාරකම් හා රැකියා කෙරෙහි හුරුවන්නට සිදු විය. ඒ අනුව හෙන්නානිගල ආදිවාසීන් හේන් ගොවිතැන, වී ගොවිතැන සිංහල මුදලාලිලාගේ වතු වල කුලී වැඩ, රියදුරන් ලෙස, වාහන අත්උදව්කරුවන් ලෙස සෞඛ්‍ය සේවයේ, ඉදිකිරීම් ක්ෂෙත්‍රයේ, හමුදා සේවයේ, ඇඟළුම් කර්මාන්ත වල මෙන්ම, මිරිදිය ධීවර කර්මාන්ත ආශ්‍රයේද වනජීවී කටයුතු වලටත් විවිධ ශාක හා සත්ව ඇටකටු ආශ්‍රයෙන් කැයම් නිර්මාණය කිරීමට පෙළඹව සිටී. ඒ තුළින් විවිධ ආකාරයට සුළු වශයෙන් ආදායම් උපයති.

කැළෑ ජීවිතයෙන් පසු ලෙඩ රෝග රාශියක් මොවුන් අතර දැකිය හැකි බව පෙනේ. එනම් රුධිර සීනි, මුත්‍රා සීනි, මුත්‍රා සමඟ ප්‍රොටීන් කාන්දු වීම, රුධිරගත කොලස්ට්‍රෝල්, වකුගඩු දියවීම, ශරීර ස්කන්ධ දර්ශකය සෙවීම මගින් පොෂණ තත්වය සෙවීම හා ඔවුන්ගේ භාහිරව දැකිය හැකි හමේ රෝග වැනි තත්වයන් තුළින් නිරෝගී පැවැත්ම කෙරෙහි හානි සිදුවී ඇත්ද යන්න තව දුරටත් අධ්‍යනය කෙරේ. එමෙන්ම ඔවුන් පානය කරන ජලය ඔවුන්ගේ වකුගඩු ආශ්‍රිත රෝග කෙරෙහි බලපාන්නට ඇත්ද යන්නත් සොයා බැලීම මෙම අධ්‍යනයෙන් සිදුකෙරේ.